# සතිපතා ආර්ථික දර්ශක

2023 පෙබරවාරි 03



සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2023 ජනවාරි මාසයේ දී සියයට 54.2ක් වාර්තා කරමින් අඛණ්ඩව සිව්වන වරටත් පහළ ගියේය. 2023 ජනවාරි මාසයේ දී ආහාර කාණ්ඩයෙහි උද්ධමනය සියයට 60.1ක් ලෙස වාර්තා වූ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි උද්ධමනය සියයට 51.0ක් ලෙස පෙන්නුම් කළේය. තවද, වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි. දර්ශකයෙහි වෙනස 2022 දෙසැම්බර් මාසයේ පැවති සියයට 46.4හි සිට 2023 ජනවාරි මාසයේ දී සියයට 49.6ක් දක්වා ඉහළ ගියේය.

අවශ්‍යතාවයට සාපේක්ෂව පොහොර හිඟවීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2022 වසර තුළ දී තේ නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ යෑමක් වාර්තා කළේය. එමෙන්ම, රබර් වගාකරන ප්‍රදේශවල පැවැති අහිතකර කාලගුණික තත්ත්ව, දිලීර රෝගයක් ව්‍යාප්තවීම  සහ පොහොර හිඟවීම යන සාධකවල ඒකාබද්ධ බලපෑම සමඟ රබර් නිෂ්පාදනය ද පහළ ගියේය. මේ අතර, 2021 වසර සහ 2022 වසර තුළ පැවති හිතකර කාලගුණ තත්ත්වයන්හි පසු බලපෑම හේතුවෙන් පොල් නිෂ්පාදනයෙහි  ඉහළ යෑමක් වාර්තා විය.

සලකා බලන කාලපරිච්ඡේදය (2023.01.28 සිට 2023.02.03 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර,  ලෝකයේ ප්‍රධාන මහ බැංකු විසින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කරනු ඇතැයි වූ අපේක්ෂාව, රුසියානු බොරතෙල් විශාල වශයෙන් වෙළඳපොළට නිකුත්වෙනු ඇතැයි ඉඟි පළවීම, එක්සත් ජනපදයේ බොරතෙල් සහ පෙට්‍රල් තොග ඉහළ යෑම මෙන්ම ඩොලරය ශක්තිමත් වීම මේ සඳහා හේතු විය. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් බොරතෙල් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල ගණන්, පිළිවෙළින්, එක්සත් ජනපද ඩොලර් 4.84කින් සහ එක්සත් ජනපද ඩොලර් 4.22කින් පහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2023 පෙබරවාරි මස 03වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 46 කින් සියයට 24.82 දක්වා පහළ ගියේය.

2022 දෙසැම්බර් මාසයේ දී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සියයට 15.5ක් විය.
2022 දෙසැම්බර් මාසයේ දී බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 178.5න් ඉහළ ගියේය.
රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2022 දෙසැම්බර් මාසයේ දී රුපියල් බිලියන 25.8න් පහළ ගියේය.
පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2022 දෙසැම්බර් මාසයේ දී රුපියල් බිලියන 72.6කින් පහළ ගියේය.

වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 326.236 හිඟයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 297.619 හිඟයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2023 පෙබරවාරි මස 03 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 2.45කින් දර්ශක අගය 9,178.61ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 1.73කින් දර්ශක අගය 2,863.64ක් දක්වා ඉහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

2022 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස එකොළහ තුළ දී රාජ්‍ය ආදායම සහ ප්‍රදාන, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 1,324.1ට සාපේක්ෂව, රු. බිලියන 1,809.7ක් දක්වා ඉහළ ගියේය.

2022 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී සමස්ත වියදම  සහ ශුද්ධ ණය දීම්, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 3,033.4ට සාපේක්ෂව, රු. බිලියන 3,411.1ක් දක්වා වැඩි විය.

2022 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස එකොළහ තුළ දී සමස්ත අයවැය හිඟය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 1,709.3ට සාපේක්ෂව, රු. බිලියන 1,601.3ක් දක්වා අඩු විය.

දේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී  පැවති රු. බිලියන 1,812.3ට සාපේක්ෂව, 2022 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස එකොළහ තුළ දී රු. බිලියන 1541.9ක් දක්වා පහළ ගියේය. විදේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 103.1ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 59.4ක ශුද්ධ ණය ලැබීමක් ලෙස වාර්තා විය.

මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2021 වසර අවසානයේ දී පැවති රු. බිලියන 17,589.4 සිට 2022 වසරේ නොවැම්බර් මාසය අවසානය වන විට රු. බිලියන 25,518.1ක් දක්වා වැඩි විය. 2022 වසරේ නොවැම්බර් මාසය අවසානය වන විට සමස්ත නොපියවූ දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 13,731.9ක් වූ  අතර සමස්ත නොපියවූ  විදේශීය ණය ප්‍රමාණය රු. බිලියන 11,786.2ක් විය.

## විදේශීය අංශය

2023 වසරේ පෙබරවාරි 03වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්‍ෂව සියයට 0.3කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන්වලට සාපේක්‍ෂව සියයට 2.6කින්, යූරෝවලට සාපේක්‍ෂව සියයට 1.8කින් ස්ටර්ලිං පවුමට සාපේක්‍ෂව සියයට 1.0කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්‍ෂව සියයට 0.5කින් අවප්‍රමාණය විය.

2022 වසරේ දෙසැම්බර් මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 1,898ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. එක්සත් ජනපද ඩොලර් බිලියන 1.4කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් මෙහි අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

2022 වසර තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 13,106ක් දක්වා සියයට 4.9කින් ඉහළ ගිය අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් (9.5%), මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ (62.8%), යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (16.0%), ඛනිජ තෙල් නිෂ්පාදිත (12.2%) සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (20.2%) අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2022 වසර තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 18,291ක් දක්වා සියයට 11.4කින් පහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ (-29.9%), මූල ලෝහ (-62.7%), බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (-39.6%) සහ ගොඩනැගිලි ද්‍රව්‍ය (-25.8%) ආනයන පහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2022 වසර තුළ දී වෙළඳ හිඟය, 2021 වසර තුළ දී වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 8,139 සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 5,185ක් දක්වා පහළ ගියේය.

කාර්මික සහ ඛනිජමය අපනයන කාණ්ඩවල මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 8.9කින් පහළ ගියේය. 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.1කින් ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ ආනයන මිල ගණන් ඉහළ යෑම හේතු විය. මේ අනුව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 82.8ක් දක්වා සියයට 13.3කින් පහළ ගියේය.

තේ සඳහා වෙන්දේසි මිලෙහි සාමාන්‍යය (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2021 වසරේ දෙසැම්බර් මාසයේ පැවති කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 3.17 සිට 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 4.05ක් දක්වා ඉහළ ගියේය. 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී බොරතෙල් සඳහා වූ ආනයන මිලෙහි සාමාන්‍යය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.6කින් ඉහළ ගියේය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | දෙසැම්බර් 2022 | මසකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - (ජා.පා.මි.ද.) | 256.3 | 256.3 | 161.0 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.0 | (0.2) | 3.7 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 50.4 | 46.7 | 7.0 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 59.2 | 65.0 | 14.0 |
| මූලික උද්ධමනය - (ජා.පා.මි.ද.) | 245.2 | 244.9 | 155.7 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 43.9 | 40.0 | 5.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 57.5 | 60.1 | 10.8 |
| **කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100)** | **ජනවාරි 2023** | **මසකට පෙර** | **වසරකට පෙර** |
| මතුපිට උද්ධමනය - (කො.පා.මි.ද.) | 244.3 | 243.2 | 158.4 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.5 | 0.2 | 2.4 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 49.6 | 46.4 | 6.9 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 54.2 | 57.2 | 14.2 |
| මූලික උද්ධමනය- (කො.පා.මි.ද.) | 224.3 | 223.4 | 154.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 37.6 | 34.6 | 5.0 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 45.6 | 47.7 | 9.9 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




## 1.2 මිල


### 1.2.1 පිටකොටුව වෙළඳපොළ


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| **සහල්** | | | | | | | | |
| සම්බා | 207.00 | 207.25 | 213.33 | 160.00 | 225.00 | 225.00 | 220.00 | 165.00 |
| රතු කැකුළු | 180.22 | 189.33 | 200.00 | 151.40 | 200.00 | 210.00 | 215.00 | 165.00 |
| **එළවළු** | | | | | | | | |
| බෝංචි | 330.00 | 310.00 | 606.00 | 245.00 | 380.00 | 360.00 | 660.00 | 287.00 |
| ගෝවා | 52.00 | 66.00 | 110.00 | 194.00 | 86.00 | 96.00 | 150.00 | 244.00 |
| කැරට් | 132.00 | 150.00 | 232.00 | 358.00 | 176.00 | 200.00 | 276.00 | 399.00 |
| තක්කාලි | 178.00 | 136.00 | 190.00 | 109.00 | 220.00 | 184.00 | 240.00 | 139.00 |
| වට්ටක්කා | 92.00 | 108.00 | 152.00 | 162.00 | 124.00 | 148.00 | 196.00 | 188.00 |
| පතෝල | 188.00 | 192.00 | 234.00 | 204.00 | 238.00 | 242.00 | 284.00 | 242.00 |
| වම්බටු | 126.00 | 150.00 | 308.00 | 242.00 | 172.00 | 196.00 | 358.00 | 290.00 |
| අමු මිරිස් | 250.00 | 290.00 | 280.00 | 415.00 | 300.00 | 340.00 | 330.00 | 470.00 |
| දෙහි | 82.00 | 78.00 | 90.00 | 77.00 | 114.00 | 104.00 | 134.00 | 109.00 |
| **අනෙකුත් ආහාර** | | | | | | | | |
| රතු පරිප්පු (දේශීය) | 465.00 | 465.00 | 596.00 | ලැනො. | 550.00 | 550.00 | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු (ආනයනික) | 126.92 | 132.28 | 158.82 | 150.18 | 160.00 | 164.00 | 184.00 | 174.00 |
| අර්තාපල් (දේශීය) | 329.53 | 360.90 | 416.25 | 264.00 | 380.00 | 420.00 | 450.00 | 296.00 |
| වියළි මිරිස් (ආනයනික) | 1,275.13 | 1,315.77 | 1,404.25 | 856.67 | 1,470.00 | 1,580.00 | 1,600.00 | 875.00 |
| රතු පරිප්පු | 347.00 | 354.67 | 356.67 | 295.00 | 375.00 | 380.00 | 380.00 | 302.50 |
| බිත්තර-සුදු (එකක මිල) | 43.00 | 43.00 | 59.20 | 16.40 | 44.00 | 44.00 | 59.30 | 16.90 |
| පොල් (ගෙඩියක මිල) | 96.80 | 95.00 | 95.00 | 73.40 | 120.00 | 120.00 | 110.00 | 74.00 |


### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| සම්බා | 196.50 | 194.70 | 198.80 | 152.00 |
| සුදු කැකුළු | 177.30 | 179.40 | 182.80 | 144.80 |
| රතු කැකුළු | 196.90 | 198.30 | 204.70 | 155.50 |
| නාඩු | 186.60 | 186.80 | 192.50 | 148.50 |


ලැනො. - ලැබී නොමැත.





### 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 226.00 | 228.40 |
| රතු කැකුළු | 211.00 | 198.40 |
| **එළවළු** | | |
| බෝංචි | 340.00 | 331.00 |
| ගෝවා | 34.50 | 35.50 |
| කැරට් | 115.00 | 119.50 |
| තක්කාලි | 173.00 | 128.50 |
| වට්ටක්කා | 56.50 | 84.50 |
| පතෝල | 102.50 | 117.00 |
| වම්බටු | 97.50 | 151.00 |
| අළු කෙසෙල් | 185.00 | 198.00 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 332.00 | 270.00 |
| රතු ළූණු (ආනයනික) | 355.00 | 355.00 |
| ලොකු ළූණු (ආනයනික) | 128.00 | 129.50 |
| අර්තාපල් (දේශීය) | 270.00 | 338.33 |
| අර්තාපල් (ආනයනික) | 104.80 | 107.00 |
| වියළි මිරිස් (ආනයනික) | 1,357.00 | 1,308.00 |
| පොල් (ගෙඩියක මිල) | 78.00 | 76.50 |

### 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 230.00 | 230.00 |
| රතු කැකුළු | 204.00 | 206.00 |
| **එළවළු** | | |
| බෝංචි | 480.00 | 520.00 |
| ගෝවා | 164.00 | 188.00 |
| කැරට් | 192.00 | 232.00 |
| තක්කාලි | 256.00 | 240.00 |
| වට්ටක්කා | 164.00 | 180.00 |
| පතෝල | 360.00 | 376.00 |
| වම්බටු | 248.00 | 344.00 |
| අමු මිරිස් | 400.00 | 420.00 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු (ආනයනික) | 162.00 | 160.00 |
| අර්තාපල් (දේශීය) | 420.00 | 480.00 |
| අර්තාපල් (ආනයනික) | 142.00 | 140.00 |
| වියළි මිරිස් (ආනයනික) | 1,364.00 | 1,476.00 |
| රතු පරිප්පු | 380.00 | 380.00 |
| සුදු සීනි | 217.00 | 215.00 |
| බිත්තර-සුදු (එකක මිල) | 44.00 | 44.00 |
| පොල් (ගෙඩියක මිල) | 110.00 | 110.00 |

### 1.2.5 මාළු වෙළඳපොළ


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය |
| කෙලවල්ලා | 1,040.00 | 1,100.00 | 990.00 | 920.00 | 1,348.00 | 1,364.00 | 1,838.00 | 1,710.00 |
| බලයා | 591.00 | 700.00 | 600.00 | 614.00 | 750.00 | 766.00 | 872.00 | 940.00 |
| සාලයා | 474.00 | 425.00 | 400.00 | 390.00 | 542.50 | 524.00 | 632.00 | 464.00 |
| හුරුල්ලා | 850.00 | 966.67 | 812.00 | 836.00 | 962.00 | 970.00 | 1,013.33 | 1,166.67 |

ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | 2020 | 2021 | 2021 | 2022 |
|---|---|---|---|---|
| | වාර්ෂික (අ) | වාර්ෂික (අ) | තෙවන කාර්තුව (අ) | තෙවන කාර්තුව (අ) |
| කෘෂිකාර්මික | (1.4) | 2.5 | (2.8) | (8.7) |
| කාර්මික | (5.3) | 5.6 | (2.0) | (21.2) |
| සේවා | (1.9) | 3.3 | (1.7) | (2.6) |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | (9.3) | (5.2) | (48.1) | (64.1) |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **(3.5)** | **3.3** | **(5.8)** | **(11.8)** |

(අ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඒකකය | 2021 ජන-දෙසැ (අ) | 2022 ජන-දෙසැ (ආ) | % වෙනස |
|---|---|---|---|---|
| තේ | (කි.ග්‍රෑ මිලියන) | 299.5 | 250.8 | (16.2) |
| රබර් | (කි.ග්‍රෑ මිලියන) | 76.9 | 70.9 | (7.8) |
| පොල් | (ගෙඩි මිලියන) | 3,119.7 | 3,386.2 | 8.5 |

(අ) සංශෝධිත (ආ) තාවකාලික





## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | නොවැම්බර් 2021 (ආ) | නොවැම්බර් 2022 (ඇ) | % වෙනස |
|---|---|---|---|
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **106.8** | **81.2** | **(23.9)** |
| ආහාර නිෂ්පාදන | 110.9 | 83.2 | (25.0) |
| ඇඟලුම් නිෂ්පාදන | 106.0 | 96.8 | (8.7) |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 137.9 | 102.5 | (25.7) |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 29.9 | 1.5 | (94.9) |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 102.6 | 83.5 | (18.7) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 102.7 | 66.8 | (35.0) |
| පාන වර්ග | 125.8 | 134.7 | 7.1 |

(අ) ප්‍රධාන උප අංශ 7


(ආ) සංශෝධිත (ඇ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

| මාසය/වසර | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | | | | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | නොවැ, 2022 | දෙසැ, 2022 | නොවැ, 2021 | දෙසැ, 2021 | නොවැ, 2022 | දෙසැ, 2022 | නොවැ, 2021 | දෙසැ, 2021 |
| දර්ශකය | 42.1 | 44.8 | 61.9 | 58.1 | 49.0 | 51.6 | 62.1 | 62.4 |









## 1.7 වැටුප් සහ සේවා නියුක්තිය

### 1.7.1 වැටුප් ප්‍රමාණ දර්ශක

| අයිතමය | 2021 දෙසැම්බර් | 2022 දෙසැම්බර් | % වෙනස |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් (2016 = 100) - නාමික | 114.6 | 133.1 | 16.1 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2018 = 100) - නාමික | 134.2 | 165.6 | 23.4 |
| කෘෂිකර්මාන්ත | 130.3 | 167.6 | 28.6 |
| කර්මාන්ත | 138.9 | 165.0 | 18.8 |
| සේවා | 127.0 | 164.7 | 29.7 |




### 1.7.2 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2022 තෙවන කාර්තුව | 2022 දෙවන කාර්තුව | 2021 වාර්ෂික |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 49.0 | 50.1 | 49.9 |
| සේවා වියුක්ති අනුපාතිකය | 5.0 | 4.6 | 5.1 |

| අයිතමය | 2022 තෙවන කාර්තුව | 2022 දෙවන කාර්තුව | 2021 වාර්ෂික |
|---|---|---|---|
| **අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් (ආ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)** | | | |
| කෘෂිකර්මාන්ත | 26.9 | 26.0 | 27.3 |
| කර්මාන්ත | 25.9 | 27.7 | 26.0 |
| සේවා | 47.2 | 46.3 | 46.7 |

(අ) වැඩ කරන වයසේ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි

(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


### 1.8 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2021 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2021 ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2021 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) | 2022 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2022 ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2022 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 54.85 | 51.65 | 57.65 | 84.96 | 82.55 | 84.09 |
| පෙබරවාරි | 61.82 | 58.63 | 64.07 | 94.17 | 91.74 | 76.41 |
| මාර්තු | 65.89 | 62.60 | - | 114.05 | 109.66 | - |
| අප්‍රේල් | 65.22 | 61.61 | 66.44 | 105.56 | 101.23 | - |
| මැයි | 68.24 | 65.13 | 68.47 | 111.91 | 109.64 | 109.94 |
| ජූනි | 73.11 | 71.01 | - | 117.29 | 113.89 | - |
| ජූලි | 74.41 | 72.79 | 68.92 | 105.39 | 100.47 | - |
| අගෝස්තු | 70.45 | 67.76 | 74.88 | 98.07 | 91.79 | 114.71 |
| සැප්තැම්බර් | 74.70 | 71.21 | - | 91.03 | 84.58 | 119.71 |
| ඔක්තෝබර් | 83.35 | 80.66 | 73.51 | 93.04 | 86.60 | - |
| නොවැම්බර් | 81.67 | 79.54 | - | 90.89 | 83.96 | 98.77 |
| දෙසැම්බර් | 74.63 | 71.55 | 85.38 | 81.80 | 77.06 | 97.03 |
| **දිනය** | **2022** | | | **2023** | | |
| ජනවාරි 28 | 89.64 | 86.97 | | - | - | |
| ජනවාරි 29 | - | - | | - | - | |
| ජනවාරි 30 | - | - | | 87.10 | 80.17 | |
| ජනවාරි 31 | 91.26 | 88.04 | | 85.18 | 78.02 | |
| පෙබරවාරි 01 | 91.21 | 88.17 | | 84.49 | 79.07 | |
| පෙබරවාරි 02 | 89.52 | 88.54 | | 83.38 | 77.00 | |
| පෙබරවාරි 03 | 89.02 | 87.64 | | 82.26 | 75.95 | |

මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං .ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය . එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ . 2021 වසරේ මාර්තු, ජූනි, සැප්තැම්බර්, නොවැම්බර් සහ 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි, ඔක්තෝබර් යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.





### 1.9 දෛනික විදුලිබල උත්පාදනය

| අයිතමය | 2023 ජන. 30 | 2023 ජන. 31 | 2023 පෙබ. 01 | 2023 පෙබ. 02 |
|---|---|---|---|---|
| **උපරිම ඉල්ලුම (මෙ. වො.)** | **2,186.10** | **2,132.40** | **1,769.80** | **2,116.70** |
| **මුළු උත්පාදනය (ගි. වො. පැ.)** | **43.58** | **44.62** | **40.92** | **42.71** |
| ජල | 15.40 | 15.01 | 11.89 | 13.84 |
| ගල් අඟුරු | 19.44 | 19.15 | 18.75 | 18.47 |
| තෙල් | 5.62 | 6.62 | 5.95 | 5.98 |
| සුළං | 0.94 | 1.80 | 2.26 | 2.45 |
| සූර්ය (තොග) | 2.05 | 1.93 | 1.94 | 1.83 |
| ජෛව ස්කන්ධය | 0.13 | 0.11 | 0.14 | 0.13 |

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය



# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| අයිතමය | 2023 පෙබරවාරි 03 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 14.50 | 14.50 | 5.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 15.50 | 15.50 | 6.50 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 15.43 | 15.39 | 6.48 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික** | | | |
| දින 91 | 29.91 | 29.91 | 8.59 |
| දින 182 | 28.72 | 28.72 | - |
| දින 364 | 27.72 | 27.78 | - |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 24.82 | 25.28 | 8.86 |
| | 2022 දෙසැ. | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 6.00 | 0.25 - 6.00 | 0.05 - 6.35 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 4.50 - 30.00 | 3.50 - 30.00 | 0.15 - 15.00 |
| | 2022 ජන. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 14.63 | 14.06 | 5.01 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 19.15 | 18.49 | 6.05 |
| | 2022 දෙසැ. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 23.07 | 23.63 | 6.45 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 23.73 | 24.05 | 6.67 |
| | 2022 දෙසැ. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 18.70 | 18.42 | 9.87 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 26.20 | 26.04 | 9.48 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| | 2022 දෙසැ. | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 12.00 | 5.50 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 2 මාස 5<br>2023 ජනවාරි 30 | වසර 4 මාස 3<br>2023 ජනවාරි 30 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 18.00 | 18.00 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 32.19 | 29.21 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2023 පෙබරවාරි 03 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2023 පෙබරවාරි 03 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 25.56 | 27.59 | කාර්ගිල්ස් බැංකුව | 28.75 | 29.95 |
| මහජන බැංකුව (අ) | 30.00 | 30.00 | එච්එස්බීසී බැංකුව | 18.81 | 20.23 |
| හැටන් නැෂනල් බැංකුව | 26.54 | 28.60 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 25.59 | 18.61 |
| කොමර්ෂල් බැංකුව | 26.48 | 28.79 | සිටි බැංකුව | 23.00 | 28.10 |
| සම්පත් බැංකුව | 25.27 | 27.55 | ඩොයිෂ් බැංකුව | 17.07 | 21.23 |
| සෙලාන් බැංකුව | 27.21 | 29.70 | හබීබ් බැංකුව | 28.97 | 28.88 |
| යූනියන් බැංකුව | 29.10 | 29.36 | ඉන්දියන් බැංකුව | 29.19 | 29.19 |
| පැන් ඒෂියා බැංකුව | 31.19 | 28.00 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව (අ) | 28.60 | 28.60 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 25.70 | 28.03 | එම්සීබී බැංකුව | 29.78 | 29.05 |
| ඩීඑෆ්සීසී බැංකුව | 27.11 | 27.93 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 26.04 | 28.80 |
| එන්ඩීබී බැංකුව | 29.10 | 30.00 | පබ්ලික් බැංකුව (අ) | 29.31 | 29.31 |
| අමානා බැංකුව (අ) | 29.54 | 29.54 | | | |

(අ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත . එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.


## 2.2 මුදල් සැපයුම


| අයිතමය | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2022 දෙසැම්බර් (අ) | මසකට පෙර | වසරකට පෙර (ආ) | 2022 දෙසැම්බර් (අ) | මසකට පෙර | වසරකට පෙර (ආ) |
| සංචිත මුදල් | 1,349.4 | 1,318.5 | 1,305.8 | 3.3 | 2.4 | 35.4 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 1,475.7 | 1,458.0 | 1,459.9 | 1.1 | 7.6 | 24.0 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 10,519.2 | 10,417.0 | 9,638.9 | 9.1 | 9.5 | 13.5 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 12,296.2 | 12,162.9 | 10,647.3 | 15.5 | 15.3 | 13.2 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් (ඇ) | (1,752.7) | (1,870.0) | (982.0) | (78.5) | (106.3) | (368.8) |
| මුදල් අධිකාරීන් | (1,606.4) | (1,639.5) | (387.3) | (314.8) | (397.0) | (173.5) |
| වාණිජ බැංකු | (146.4) | (230.4) | (594.7) | 75.4 | 60.0 | 19.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | (426.9) | (523.4) | (381.5) | (11.9) | (36.7) | 10.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 280.5 | 292.9 | (213.2) | 231.6 | 251.4 | 31.0 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් (ඇ) | 14,049.0 | 14,032.9 | 11,629.3 | 20.8 | 22.5 | 20.9 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 7,471.1 | 7,292.6 | 5,832.4 | 28.1 | 27.6 | 28.2 |
| මහ බැංකුව | 3,432.5 | 3,369.8 | 2,094.1 | 63.9 | 69.0 | 141.0 |
| වාණිජ බැංකු | 4,038.6 | 3,922.8 | 3,738.3 | 8.0 | 5.4 | 1.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,639.3 | 3,499.6 | 3,361.3 | 8.3 | 5.0 | 4.9 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 399.3 | 423.2 | 377.0 | 5.9 | 8.9 | (20.7) |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,734.5 | 1,760.4 | 1,188.1 | 46.0 | 48.6 | 18.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,674.2 | 1,698.2 | 972.8 | 72.1 | 89.2 | 66.5 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 60.3 | 62.2 | 215.3 | (72.0) | (78.4) | (48.5) |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,426.6 | 7,499.2 | 6,981.4 | 6.4 | 8.4 | 13.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,747.5 | 6,802.5 | 6,498.9 | 3.8 | 6.0 | 13.1 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 679.1 | 696.7 | 482.6 | 40.7 | 39.3 | 14.1 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (2,583.3) | (2,519.3) | (2,372.7) | (8.9) | (6.5) | (12.7) |


(අ) තාවකාලික

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්තා කරන ලද ඇතැම් දත්ත නිවැරදිව වර්ගීකරණය නොකිරීම හේතුවෙන්, 2021 මාර්තු සිට 2022 ජනවාරි මස දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විසින් රජය වෙත ලබා දුන් ණය පිළිබඳ දත්ත සංශෝධනය කරන ලදී.

(ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අදාළව





## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| අයිතමය | 2023 ජන. 26 | 2023 පෙබ. 02 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,587,612.72 | 1,646,632.86 | 59,020.14 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| අයිතමය | 2023 ජන. 30 | 2023 ජන. 31 | 2023 පෙබ. 01 | 2023 පෙබ. 02 | 2023 පෙබ. 03 |
|---|---|---|---|---|---|
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 15.49 | 15.26 | 15.47 | 15.44 | 15.48 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 9,390 | 4,200 | 9,102 | 10,385 | 6,425 |
| **වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 15.50 | 15.50 | 15.50 | 15.50 | 15.50 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 2,000 | 14,900 | 10,950 | 5,500 | 5,150 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| අයිතමය | 2023 ජන. 30 | 2023 ජන. 31 | 2023 පෙබ. 01 | 2023 පෙබ. 02 | 2023 පෙබ. 03 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් /බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් මිලියන) | 2,548,988.12 | 2,548,988.12 | 2,548,988.12 | 2,548,988.12 | 2,558,607.17 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් /බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් මිලියන) | 2,464,450.84 | 2,465,733.08 | 2,467,429.50 | 2,469,140.05 | 2,467,505.93 |

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2023 ජන. 30 | 2023 ජන. 31 | 2023 පෙබ. 01 | 2023 පෙබ. 02 | 2023 පෙබ. 03 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 30.00 | | | | 10.00 |
| කාල සීමාව (දින ගණන) | 4 | | | | 3 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 24.500 | | | | 23.000 |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 20.500 | | | | 10.000 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 15.50 | | | | 15.50 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 15.50 | | | | 15.50 |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 15.50 | | | | 15.50 |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 91.479 | 74.107 | 0.000 | 0.000 | 295.218 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 120.498 | 118.953 | 109.521 | 101.023 | 132.837 |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | (49.519) | (44.846) | (109.521) | (101.023) | 152.381 |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)**** | (520.019) | (515.346) | (580.021) | (571.523) | (297.619) |

**සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි .

## 2.7 ණය කාඩ්පත් (අ)

| අයිතමය | 2021 දෙසැ. අවසානයට | 2022 නොවැම්බර් අවසානයට | 2022 දෙසැම්බර් අවසානයට (ආ) |
|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | 1,927,195 | 1,954,165 | 1,952,991 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 15,861 | 13,445 | 13,028 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,911,334 | 1,940,720 | 1,939,963 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 133,285 | 140,423 | 143,098 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 38,719 | 37,136 | 37,328 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 94,565 | 103,287 | 105,770 |


(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික


## 2.8 වාණිජ පත්‍රිකා නිකුතු (අ)

| අයිතමය (රු. බිලියන) | 2021 දෙසැ. අවසානයට | 2022 නොවැම්බර් අවසානයට | 2022 දෙසැම්බර් අවසානයට (ආ) |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) (ඇ) | 5.8 | 2.0 | 2.0 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 1.1 | 0.2 | 0.2 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව

(ආ) තාවකාලික (ඇ) වසරේ මේ දක්වා එකතුව




## 2.9 කොටස් වෙළඳපොළ


| අයිතමය | 2023 පෙබරවාරි 03 වැනි දිනට | 2023 ජනවාරි 27 වැනි දිනට | වසරකට පෙර |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 9,178.61 | 8,958.79 | 12,762.60 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 2,863.64 | 2,815.00 | 4,333.76 |
| දෛනික පිරිවැටුම (සතිපතා සාමාන්‍යය) (රු. මිලියන) | 2,180.95 | 1,745.00 | 8,009.74 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 4,060.93 | 3,912.84 | 5,738.30 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 949.29 | 127.64 | 81.06 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 55.89 | 192.11 | 169.72 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | 893.40 | (64.47) | (88.66) |

# රාජ්‍ය මූල්‍ය අංශය

### 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2021 ජන.-නොවැ. | 2022 ජන.-නොවැ.[අ] |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **1,324.1** | **1,809.7** |
| ආදායම | 1,322.0 | 1,806.7 |
| බදු ආදායම | 1,188.5 | 1,608.8 |
| බදු නොවන | 133.5 | 197.9 |
| ප්‍රදාන | 2.2 | 3.1 |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්** | **3,033.4** | **3,411.1** |
| පුනරාවර්තන | 2,551.2 | 2,945.0 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණය දීම් | 482.2 | 466.0 |

(අ) තාවකාලික





### 3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන) [අ]

| ශීර්ෂය | 2021 වසර අවසානයට | 2022 නොවැම්බර් අවසානයට[ආ] |
|---|---|---|
| සමස්ත දේශීය ණය | 11,097.2 | 13,731.9 |
| එයින් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 2,270.5 | 3,966.8 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 6,966.2 | 8,515.8 |
| රුපියල් ණය | 24.1 | 24.1 |
| සමස්ත විදේශීය ණය | 6,492.2 | 11,786.2 |
| **මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය** | **17,589.4** | **25,518.1** |

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත.

(ආ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ යම් විදේශ ණය සේවාකරණ ගෙවීම්, රාජ්‍ය ණය සම්බන්ධ දත්ත සකස් කිරීමේ දී ගැලපුම් ගත කර නොමැති නිසා 2022 අප්‍රේල් මාසයෙන් පසු මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය පිළිබඳ දත්ත තාවකාලික වේ. ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව, බලපෑමකට ලක්වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම්, මෙලෙස ගැලපුම් සිදු කර නොමැති ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.




මූලයන් : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

### 3.3 රාජ්‍ය සුරැකුම්පත් - ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික 2023 පෙබරවාරි 01 දිනෙන් අවසන් වූ සතියට


| සුරැකුම්පත | පරිණත කාලය | ප්‍රාථමික වෙළඳපොළ [අ] % | | ද්විතීයික වෙළඳපොළ [ආ] % | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මෙම සතිය | | | පසුගිය සතියේ සාමාන්‍යය |
| | | මෙම සතිය | පසුගිය සතිය | මිලට ගැනීමේ අනුපාතිකය | විකුණුම් අනුපාතිකය | සාමාන්‍යය | |
| භාණ්ඩාගාර බිල්පත් | දින 91 | 29.91 | 29.91 | 29.93 | 28.57 | 29.25 | 29.23 |
| | දින 182 | 28.72 | 28.72 | 28.91 | 27.68 | 28.30 | 28.38 |
| | දින 364 | 27.72 | 27.78 | 28.14 | 26.97 | 27.55 | 27.61 |
| භාණ්ඩාගාර බැඳුම්කර | < වසර 02 | - | - | 28.95 | 27.51 | 28.23 | 27.97 |
| | < වසර 03 | 32.19 | - | 28.12 | 26.93 | 27.53 | 27.66 |
| | < වසර 04 | - | - | 28.02 | 26.77 | 27.39 | 27.15 |
| | < වසර 05 | 29.21 | - | 27.50 | 26.15 | 26.82 | 26.92 |
| | < වසර 06 | - | - | 26.65 | 25.11 | 25.88 | 25.96 |
| | < වසර 08 | - | - | 26.43 | 24.76 | 25.60 | 25.57 |
| | < වසර 10 | - | - | 26.84 | 24.69 | 25.77 | 25.84 |
| | < වසර 15 | - | - | 26.27 | 22.91 | 24.59 | 24.74 |
| | < වසර 20 | - | - | 23.53 | 20.80 | 22.16 | 22.16 |
| | < වසර 30 | - | - | 22.51 | 20.27 | 21.39 | 21.39 |


(අ) 2023 පෙබරවාරි 01 දිනෙන් අවසන් වූ සතිය තුළ සිදු වූ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු

(ආ) ද්විතීයික වෙළඳපොළ තුළ ඉදිරිපත්කල ඵලදා අනුපාතිකයන්ගේ මධ්‍යනය

**මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍ර පුළුල් ලෙස ගත් කල ස්ථාවරව පැවතුණි.**

| සුරැකුම්පත | පරිණත දිනය | කූපන් අනුපාතිකය % | ද්විතීයික වෙළඳපොළ % | |
|---|---|---|---|---|
| | | | මෙම සතිය | පසුගිය සතිය |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2023 අප්‍රේල් 18 | 5.750 | - | - |
| | 2024 මාර්තු 14 | 6.850 | - | - |
| | 2024 ජුනි 28 | 6.350 | - | - |
| | 2025 ජුනි 03 | 6.125 | - | - |
| | 2025 නොවැ. 03 | 6.850 | - | - |
| | 2026 ජූලි 18 | 6.825 | 42.22 | 41.63 |
| | 2027 මැයි 11 | 6.200 | 36.90 | 35.99 |
| | 2028 අප්‍රේල් 18 | 6.750 | 33.42 | 32.64 |
| | 2029 මාර්තු 14 | 7.850 | 32.95 | 32.02 |
| | 2030 මාර්තු 28 | 7.550 | 29.51 | 28.89 |



## 3.4 රාජ්‍ය සුරැකුම්පත්- 2023 පෙබරවාරි 01 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සාරාංශය

| අයිතමය | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 4,265,021.86 | 4,224,807.58 |
| භාණ්ඩාගාර බැඳුම්කර [අ] | 8,896,525.39 | 8,828,617.39 |
| **එකතුව** | **13,161,547.25** | **13,053,424.97** |
| අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර | 25,477.06 | 25,471.05 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර [ආ] | 343,236.81 | 343,255.77 |

**පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 0.02ක සුළු වැඩිවීමක් පෙන්නුම් කර ඇත.**

| ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 120,000.00 | 120,000.00 |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 204,839.00 | 201,412.00 |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 45,606.00 | 120,000.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 70,000.00 | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 118,628.00 | - |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 67,908.00 | - |

**මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් වෙන්දේසි සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 1.7 ගුණයකි.**

| ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 119,012.14 | 119,206.09 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 212,511.63 | 228,764.02 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 162,829.38 | 145,815.88 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 485,503.78 | 492,484.00 |

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 0.65ක ප්‍රතිශතයකින් පහළ යාමක් දක්නට ලැබේ.**

අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද, 2032.01.01 දින පරිණත වීමට නියමිත රු. මිලියන 31,445.60ක භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් වේ.

ආ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල පියවීමට ඇති ණය මුදල 2022 දෙසැම්බර් 30 දිනට ආයෝජක තහවුරු කිරීම් මත පදනම්ව අදාළ සුරැකුම් පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංකය නිකුත් කිරීම් මත පදනම් වේ.

## 3.5 ද්වී පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත්) - 2023 පෙබරවාරි 03

| පරිණතියට ඇති ඉතිරි කාලය | සාමාන්‍ය ගැනුම් මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැනුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|
| 1-7 දින | 99.5902 | 21.40 | 99.6334 | 19.13 | 0.0431 |
| මාස 1 | 98.0148 | 24.57 | 98.2039 | 22.19 | 0.1891 |
| මාස 2 | 95.8484 | 26.28 | 96.2512 | 23.63 | 0.4028 |
| මාස 3 | 93.0533 | 29.86 | 93.3348 | 28.56 | 0.2815 |
| මාස 4 | 91.6148 | 27.76 | 92.0690 | 26.13 | 0.4543 |
| මාස 5 | 89.7228 | 27.80 | 90.2218 | 26.30 | 0.4990 |
| මාස 6 | 87.3571 | 28.95 | 87.8668 | 27.62 | 0.5097 |
| මාස 7 | 86.2702 | 27.59 | 86.8709 | 26.20 | 0.6006 |
| මාස 8 | 84.5808 | 27.65 | 85.2435 | 26.26 | 0.6626 |
| මාස 9 | 82.9728 | 27.67 | 83.7282 | 26.20 | 0.7554 |
| මාස 10 | 81.4364 | 27.66 | 82.3992 | 25.92 | 0.9628 |
| මාස 11 | 80.0547 | 27.48 | 80.8365 | 26.15 | 0.7819 |
| මාස 12 | 78.0918 | 28.05 | 78.9149 | 26.72 | 0.8231 |


## 3.6 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැඳුම්කර) - 2023 පෙබරවාරි 03

| භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය | පරිණත කාලය (වසර ගණන) | පරිණත දිනය (දිනය/මාසය /වර්ෂය ) | පරිණතියට ඇති දින ගණන | සාමාන්‍ය ගැනුම් මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැනුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|---|---|---|
| 10.00%2023A | 6 | 2023 මාර්තු 15 | 40 | 98.2744 | 25.07 | 98.4413 | 23.56 | 0.1669 |
| 11.50%2023A | 6 | 2023 මැයි 15 | 101 | 96.1798 | 25.52 | 96.6270 | 23.79 | 0.4472 |
| 10.20%2023A | 5 | 2023 ජූලි 15 | 162 | 93.4566 | 26.41 | 94.1411 | 24.60 | 0.6846 |
| 09.00%2023A | 10 | 2023 සැප්තැම්බර් 1 | 210 | 91.2619 | 26.38 | 92.0519 | 24.68 | 0.7900 |
| 11.20%2023A | 9 | 2023 සැප්තැම්බර් 1 | 210 | 91.9594 | 27.23 | 92.7779 | 25.48 | 0.8184 |
| 07.00%2023A | 20 | 2023 ඔක්තෝබර් 1 | 240 | 88.5986 | 27.01 | 89.6741 | 24.93 | 1.0755 |
| 06.30%2023A | 3 | 2023 නොවැම්බර් 15 | 285 | 86.0728 | 27.26 | 87.4199 | 24.99 | 1.3470 |
| 11.60%2023A | 5 | 2023 දෙසැම්බර් 15 | 315 | 88.3964 | 27.51 | 89.7036 | 25.55 | 1.3072 |
| 11.40%2024A | 10 | 2024 ජනවාරි 1 | 332 | 87.6338 | 27.63 | 88.5461 | 26.31 | 0.9123 |
| 10.90%2024A | 5 | 2024 මාර්තු 15 | 406 | 84.9876 | 27.41 | 86.4333 | 25.64 | 1.4457 |
| 22.50%2024A | 2 | 2024 මැයි 1 | 453 | 91.7400 | 30.80 | 92.7184 | 29.74 | 0.9784 |
| 10.25%2024A | 5 | 2024 ජූනි 15 | 498 | 81.0127 | 27.88 | 82.4198 | 26.38 | 1.4072 |
| 11.00%2024A | 8 | 2024 අගෝස්තු 1 | 545 | 79.5748 | 28.76 | 81.6486 | 26.68 | 2.0738 |
| 09.85%2024A | 5 | 2024 සැප්තැම්බර් 15 | 590 | 77.6824 | 27.95 | 79.4100 | 26.30 | 1.7276 |
| 22.00%2024A | 2 | 2024 නොවැම්බර් 15 | 651 | 90.6506 | 28.95 | 91.8907 | 27.96 | 1.2401 |
| 06.00%2024A | 10 | 2024 දෙසැම්බර් 1 | 667 | 70.2209 | 27.89 | 72.0581 | 26.20 | 1.8372 |
| 22.50%2025A | 3 | 2025 ජනවාරි 15 | 712 | 87.9052 | 31.19 | 89.9817 | 29.58 | 2.0764 |
| 10.25%2025A | 10 | 2025 මාර්තු 15 | 771 | 72.6891 | 28.26 | 74.4087 | 26.88 | 1.7196 |
| 09.00%2025A | 12 | 2025 මැයි 1 | 818 | 69.3991 | 28.32 | 71.1443 | 26.94 | 1.7452 |
| 17.00%2025A | 3 | 2025 ජූනි 1 | 849 | 78.8134 | 30.26 | 81.3304 | 28.44 | 2.5170 |
| 18.00%2025A | 3 | 2025 ජූලි 1 | 879 | 78.3648 | 31.40 | 79.5695 | 30.53 | 1.2047 |
| 11.00%2025A | 10 | 2025 අගෝස්තු 1 | 910 | 68.9479 | 29.43 | 71.4584 | 27.56 | 2.5105 |
| 10.35%2025A | 8 | 2025 ඔක්තෝබර් 15 | 985 | 67.2919 | 28.50 | 69.2289 | 27.13 | 1.9370 |
| 06.75%2026A | 5 | 2026 ජනවාරි 15 | 1,077 | 59.7759 | 27.54 | 61.2446 | 26.50 | 1.4686 |
| 09.00%2026A | 13 | 2026 පෙබරවාරි 1 | 1,094 | 63.7401 | 27.56 | 65.4240 | 26.42 | 1.6839 |
| 05.35%2026A | 15 | 2026 මාර්තු 1 | 1,122 | 55.8532 | 27.56 | 57.5761 | 26.33 | 1.7229 |
| 22.50%2026A | 4 | 2026 මැයි 15 | 1,197 | 85.2986 | 29.73 | 87.2825 | 28.64 | 1.9838 |
| 11.00%2026A | 11 | 2026 ජූනි 1 | 1,214 | 65.2134 | 27.62 | 67.1300 | 26.43 | 1.9166 |
| 11.50%2026A | 10 | 2026 අගෝස්තු 1 | 1,275 | 64.6115 | 28.03 | 66.9336 | 26.61 | 2.3221 |
| 11.40%2027A | 8 | 2027 ජනවාරි 15 | 1,442 | 62.2876 | 27.68 | 64.7279 | 26.27 | 2.4403 |
| 18.00%2027A | 5 | 2027 මැයි 1 | 1,548 | 74.1389 | 28.90 | 75.5867 | 28.16 | 1.4479 |
| 11.75%2027A | 10 | 2027 ජූනි 15 | 1,593 | 60.9990 | 27.65 | 63.6535 | 26.18 | 2.6545 |
| 07.80%2027A | 7 | 2027 අගෝස්තු 15 | 1,654 | 50.4847 | 27.59 | 53.4494 | 25.80 | 2.9647 |
| 20.00%2027A | 5 | 2027 සැප්තැම්බර් 15 | 1,685 | 76.5057 | 29.61 | 77.8935 | 28.93 | 1.3878 |
| 10.30%2027A | 8 | 2027 ඔක්තෝබර් 15 | 1,715 | 55.8582 | 27.60 | 58.7054 | 26.00 | 2.8472 |
| 11.25%2027A | 10 | 2027 දෙසැම්බර් 15 | 1,776 | 57.0091 | 27.90 | 59.9012 | 26.31 | 2.8921 |
| 18.00%2028A | 6 | 2028 ජනවාරි 15 | 1,807 | 74.3887 | 27.81 | 77.9570 | 26.18 | 3.5683 |
| 10.75%2028A | 10 | 2028 මාර්තු 15 | 1,867 | 57.0913 | 26.54 | 59.2412 | 25.41 | 2.1499 |
| 09.00%2028B | 15 | 2028 මැයි 1 | 1,914 | 51.3880 | 26.74 | 53.7524 | 25.43 | 2.3645 |
| 09.00%2028A | 15 | 2028 ජූලි 1 | 1,975 | 50.2370 | 27.00 | 52.9895 | 25.46 | 2.7525 |
| 11.50%2028A | 13 | 2028 සැප්තැම්බර් 1 | 2,037 | 57.4023 | 26.55 | 60.2029 | 25.14 | 2.8005 |
| 13.00%2029A | 15 | 2029 ජනවාරි 1 | 2,159 | 59.9935 | 26.85 | 63.4835 | 25.18 | 3.4900 |
| 13.00%2029B | 15 | 2029 මැයි 1 | 2,279 | 59.6406 | 26.55 | 62.9038 | 25.02 | 3.2631 |
| 20.00%2029A | 7 | 2029 ජූලි 15 | 2,354 | 78.1799 | 27.36 | 83.4342 | 25.33 | 5.2543 |
| 11.00%2030A | 15 | 2030 මැයි 15 | 2,658 | 51.2160 | 26.38 | 55.5001 | 24.30 | 4.2841 |
| 11.25%2031A | 12 | 2031 මාර්තු 15 | 2,962 | 50.9894 | 26.02 | 54.3427 | 24.42 | 3.3533 |
| 18.00%2031A | 9 | 2031 මැයි 15 | 3,023 | 71.1539 | 26.79 | 75.3018 | 25.20 | 4.1479 |
| 12.00%2031A | 10 | 2031 දෙසැම්බර් 1 | 3,223 | 50.9682 | 26.66 | 54.2936 | 25.06 | 3.3254 |
| 08.00%2032A | 20 | 2032 ජනවාරි 1 | 3,254 | 37.5433 | 26.63 | 40.5600 | 24.86 | 3.0167 |
| 18.00%2032A | 10 | 2032 ජූලි 1 | 3,436 | 68.8852 | 27.31 | 74.0999 | 25.31 | 5.2147 |
| 09.00%2032A | 20 | 2032 ඔක්තෝබර් 1 | 3,528 | 39.3759 | 26.80 | 41.7536 | 25.42 | 2.3778 |
| 11.20%2033A | 15 | 2033 ජනවාරි 15 | 3,634 | 46.1236 | 27.02 | 51.4364 | 24.36 | 5.3128 |
| 09.00%2033A | 20 | 2033 ජූනි 1 | 3,771 | 38.2275 | 26.95 | 43.7097 | 23.88 | 5.4822 |
| 13.25%2033A | 20 | 2033 ජූලි 1 | 3,801 | 52.8634 | 26.90 | 59.9475 | 23.78 | 7.0841 |
| 09.00%2033B | 20 | 2033 නොවැම්බර් 1 | 3,924 | 37.9696 | 26.80 | 43.9605 | 23.48 | 5.9908 |
| 13.25%2034A | 20 | 2034 ජනවාරි 1 | 3,985 | 53.3758 | 26.44 | 61.6000 | 22.96 | 8.2242 |
| 10.25%2034A | 15 | 2034 සැප්තැම්බර් 15 | 4,242 | 42.5587 | 26.20 | 49.2248 | 22.88 | 6.6662 |
| 11.50%2035A | 20 | 2035 මාර්තු 15 | 4,423 | 47.7906 | 25.63 | 55.1955 | 22.33 | 7.4049 |
| 10.50%2039A | 20 | 2039 අගෝස්තු 15 | 6,037 | 42.1822 | 25.55 | 48.6734 | 22.30 | 6.4912 |
| 12.00%2041A | 25 | 2041 ජනවාරි 1 | 6,542 | 54.3110 | 22.50 | 61.2745 | 20.00 | 6.9634 |
| 09.00%2043A | 30 | 2043 ජූනි 1 | 7,423 | 40.6696 | 22.53 | 45.8533 | 20.10 | 5.1837 |
| 13.50%2044A | 30 | 2044 ජනවාරි 1 | 7,637 | 60.2744 | 22.55 | 67.3771 | 20.20 | 7.1027 |
| 13.50%2044B | 30 | 2044 ජූනි 1 | 7,789 | 60.1615 | 22.57 | 67.0822 | 20.27 | 6.9207 |
| 12.50%2045A | 30 | 2045 මාර්තු 1 | 8,062 | 56.1273 | 22.42 | 61.9742 | 20.33 | 5.8469 |

# විදේශීය අංශය

## 4.1 විනිමය අනුපාතික (අ)

| අයිතමය (ඒකකයකට රුපියල්)(ආ) | 2023 පෙබරවාරි 03 දිනෙන් අවසන් වූ සතිය | | | සාමාන්‍යය අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| | ගැනුම් | විකුණුම් | සාමාන්‍යය | සතියකට | වසරකට |
| එ.ජ. ඩොලර් | 360.29 | 370.35 | 365.32 | 365.94 | 200.75 |
| ස්ටර්ලිං පවුම් | 437.36 | 453.83 | 445.59 | 453.29 | 272.20 |
| ජපන් යෙන් | 2.78 | 2.89 | 2.84 | 2.82 | 1.76 |
| යුරෝ | 390.01 | 405.25 | 397.63 | 397.88 | 228.37 |
| ඉන්දියානු රුපියල්(ඇ) | | | 4.41 | 4.44 | 2.69 |
| විශේෂ ගැනුම් හිමිකම් ( 2023 පෙබරවාරි 02 දිනට ) | | | 491.56 | 489.82 | 282.13 |
| මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම් (ඈ) (එ.ජ. ඩොලර් මිලියන ) | | | 2022 දෙසැම්බර් | මසකට පෙර | වසරකට පෙර |
| මිලදී ගැනීම් | | | 274.42 | 219.09 | 71.16 |
| විකිණීම් | | | 170.64 | 212.69 | 424.71 |




| අයිතමය | 2023 පෙබරවාරි 03 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 15.56 | 29.91 | 15.69 |
| (වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු) | | | |
| ඉදිරි විනිමය ගනුදෙනු | | | |
| ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්) (ඉ) | | | |
| මාස 1 | 369.03 | 365.30 | 200.89 |
| මාස 3 | 377.53 | - | 199.44 |
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 18.73 | 27.91 | 17.90 |
| නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) ( 2023 පෙබරවාරි 02 දිනට ) | 296.89 | 289.15 | 796.94 |

(අ) මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මස 13 වැනි දින සිට අන්තර් බැංකු බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයෙහි මධ්‍යය අනුපාතිකය සහ විචලන සීමාව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කළේය .

(ආ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව. 9.30 ට පවතින)

(ඇ) මහ බැංකුවේ දෛනික මධ්‍යය විනිමය අනුපාතිකය

(ඈ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්

(ඉ) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය


## 4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ


| අයිතමය | | 2021 දෙසැම්බර් | 2022(අ) දෙසැම්බර් | 2021 ජන.-දෙසැ. | 2022(අ) ජන.-දෙසැ. | % වෙනස |
|---|---|---|---|---|---|---|
| **සංචාරක පැමිණීම්** | සංඛ්‍යාව | 89,506 | 91,961 | 194,495 | 719,978 | 270.2 |
| **සංචාරක ඉපැයීම්** | (එ.ජ. ඩොලර් මිලියන) | 233.3 (ආ) | 127.4 | 506.9 (ආ) | 1,136.3 (ඇ) | 124.2 |
| | (රුපියල් බිලියන) | 47.0 (ආ) | 46.3 | 101.9 (ආ) | 338.1 (ඇ) | 231.7 |
| | | 2021 දෙසැම්බර් | 2022(අ) දෙසැම්බර් | 2021 ජන.-දෙසැ. | 2022(අ) ජන.-දෙසැ. | % වෙනස |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්** | (එ.ජ. ඩොලර් මිලියන) | 325.2 | 475.6 | 5,491.5 | 3,789.5 | (31.0) |
| | (රුපියල් බිලියන) | 65.5 | 172.7 | 1,087.2 | 1,252.5 | 15.2 |

(අ) තාවකාලික

(ආ) 2021 වසරේ දී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය වී ඇත.

(ඇ) 2022 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංශෝධනය කරන ලදී .



## 4.3 2022 දෙසැම්බර් මස අවසානයට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය [අ]

| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|
| නිල සංචිත වත්කම් [ආ] | **1,898** |
| (1) විදේශ මුදල් සංචිත | 1,863 |
| (අ) සුරැකුම්පත් | 30 |
| (ආ) මුළු මුදල් සහ තැන්පතු | 1,833 |
| (i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා .මූ.අරමුදල සමඟ | 1,809 |
| (ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 0.1 |
| (iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 24 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 4 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 2 |
| (4) රත්‍රන් | 28 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1 |

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් [ඇ] (එ.ජ. ඩොලර් මිලියන)

| අයිතමය | එකතුව | කල්පිරීම | | |
|---|---|---|---|---|
| | | මාසයක් ඇතුලත | මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා | මාස 3 ට වැඩි සහ වසරක් දක්වා |
| 1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු [ඈ] | (3,185) | (69) | (160) | (2,956) |
| ගෙවීම් (–) ණය වාරික ආපසු ගෙවීම | (2,738) | (50) | (85) | (2,603) |
| පොලිය | (447) | (19) | (75) | (353) |
| ලැබීම් (+) ණය වාරික ආපසු ලැබීම | | | | |
| පොලිය | | | | |
| 2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව) | (2,000) | (291) | (44) | (1,665) |
| (i) හිඟ (–)[ඉ] | (2,263) | (479) | (119) | (1,665) |
| (ii) අතිරික්ත (+) | 263 | 188 | 75 | - |
| 3. අනෙකුත් | (3) | (3) | | |
| ප්‍රතිවිකිණුම් හා සම්බන්ධ ලැබීම් (+) | | | | |
| ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ගෙවීම් (-) | | | | |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–) | (3) | (3) | | |

(අ) තාවකාලික

(ආ) එ.ජ. ඩොලර් බිලියන 1.4කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වන අතර , එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

(ඇ) මෙහි ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම් ප්‍රධාන වශයෙන් අන්තර්ගත වේ.

(ඈ) තෝරාගත් විදේශීය ණය සේවාකරණයන් තාවකාලිකව අත්හිටුවන බවට රජය විසින් නිවේදනය කිරීමෙන් පසුව , පුරෝකථනය කරන ලද කෙටි කාලීන ශුද්ධ ගෙවීම් ඇතුළත් වේ.


(ඉ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ .

## 4.4 විදේශීය වෙළඳාම


| අයිතමය | එ.ජ. ඩොලර් මිලියන | | | රුපියල් මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2021 ජන.- දෙසැ. | 2022 ජන.- දෙසැ. (අ) | % වෙනස | 2021 ජන.- දෙසැ. | 2022 ජන.- දෙසැ. (අ) | % වෙනස |
| **අපනයන** | **12,498.6** | **13,106.4** | **4.9** | **2,486,943.1** | **4,234,913.1** | **70.3** |
| කෘෂිකාර්මික | 2,729.5 | 2,568.0 | (5.9) | 543,083.2 | 835,007.4 | 53.8 |
| කාර්මික | 9,702.0 | 10,465.3 | 7.9 | 1,930,514.7 | 3,375,846.5 | 74.9 |
| ආහාර, පාන හා දුම්කොළ | 586.9 | 519.5 | (11.5) | 116,860.2 | 166,431.1 | 42.4 |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,435.1 | 5,952.0 | 9.5 | 1,081,158.2 | 1,922,051.1 | 77.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 506.4 | 568.0 | 12.2 | 100,974.9 | 177,194.3 | 75.5 |
| සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත | 1,108.8 | 1,062.8 | (4.1) | 220,610.9 | 342,890.8 | 55.4 |
| වෙනත් | 2,064.8 | 2,362.9 | 14.4 | 410,910.5 | 767,279.2 | 86.7 |
| ඛනිජ අපනයන | 44.5 | 50.0 | 12.3 | 8,841.4 | 16,464.6 | 86.2 |
| වෙනත් අපනයන | 22.6 | 23.2 | 2.6 | 4,503.8 | 7,594.7 | 68.6 |
| **ආනයන** | **20,637.4** | **18,291.0** | **(11.4)** | **4,104,217.5** | **5,737,333.4** | **39.8** |
| පාරිභෝගික භාණ්ඩ | 3,848.7 | 2,813.0 | (26.9) | 764,978.6 | 872,256.4 | 14.0 |
| අන්තර් භාණ්ඩ | 12,308.9 | 12,438.8 | 1.1 | 2,447,907.0 | 3,934,047.4 | 60.7 |
| ආයෝජන භාණ්ඩ | 4,462.7 | 3,030.5 | (32.1) | 887,913.8 | 928,088.6 | 4.5 |
| වෙනත් | 17.1 | 8.8 | (48.8) | 3,418.2 | 2,941.1 | (14.0) |
| **වෙළඳ ශේෂය** | **(8,138.8)** | **(5,184.6)** | | **(1,617,274.4)** | **(1,502,420.2)** | |

(අ) තාවකාලික


ආනයන





අපනයන





වෙළඳ දර්ශක (2010= 100 )





තේ මිල (වෙන්දේසි)




සහල් මිල (ආනයනික)




බොරතෙල් මිල (ආනයනික)




## 4.5 වෙළඳ දර්ශක (2010= 100 ) (අ)

| අයිතමය | 2022 දෙසැ. (ආ) | පෙර මාසය (ආ) | පෙර වසර |
|---|---|---|---|
| මුළු අපනයන | | | |
| වටිනාකම | 148.6 | 138.5 | 160.9 |
| ප්‍රමාණය | 171.3 | 141.8 | 169.0 |
| ඒකක වටිනාකම | 86.8 | 97.7 | 95.2 |
| මුළු ආනයන | | | |
| වටිනාකම | 127.6 | 129.3 | 200.6 |
| ප්‍රමාණය | 121.8 | 117.7 | 201.3 |
| ඒකක වටිනාකම | 104.8 | 109.8 | 99.6 |
| වෙළෙඳ මිල අනුපාතය | 82.8 | 88.9 | 95.5 |

(අ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද (ආ) තාවකාලික

## 4.6 වෙළඳ භාණ්ඩ මිල ගණන්

| අයිතමය | 2021 දෙසැම්බර් | 2022 දෙසැම්බර් (අ) | % වෙනස | 2021 දෙසැම්බර් | 2022 දෙසැම්බර් (අ) | % වෙනස |
|---|---|---|---|---|---|---|
| කොළඹ තේ වෙන්දේසිය | කි.ග්‍රෑම් 1 ක් එ.ජ. ඩො. | | | කි.ග්‍රෑම් 1 ක් රුපියල් | | |
| තේ මිල | 3.17 | 4.05 | 27.7 | 638.13 | 1,469.43 | 130.3 |
| ආනයන (මි.ර.ගා.) | මෙට්‍රික් ටොන් 1 ක් එ.ජ. ඩො. | | | මෙට්‍රික් ටොන් 1 ක් රුපියල් | | |
| සහල් | 463.70 | 361.02 | (22.1) | 93,388.85 | 131,109.15 | 40.4 |
| සීනි | 547.76 | 519.91 | (5.1) | 110,317.92 | 188,813.00 | 71.2 |
| තිරිඟු | 348.66 | 435.31 | 24.9 | 70,219.69 | 158,089.75 | 125.1 |
| | බැරලයක් එ.ජ. ඩො. | | | බැරලයක් රුපියල් | | |
| බොරතෙල් | 85.38 | 97.03 | 13.6 | 17,195.45 | 35,238.27 | 104.9 |

(අ) තාවකාලික